කාර්යසාධන වාර්තාව

2021

වැය ශීර්ෂ අංකය - 418

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

சிறைச்சாலைகள் முகாமைத்துவம் மற்றும் சிறைக்கைதிகள் புனர்வாழ்வு நடவடிக்கைகள் இராஜாங்க அமைச்சு

State Ministry of Prison Management and Prisoners' Rehabilitation Affairs

පෙළගැස්ම

<u>අන්තර්ගතය</u>

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ක්‍රියාවට නැංවීමේ සාරාංශය **1**

1.1. හැඳින්වීම 1

1.2. දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3. කර්තව්‍යයන් හා කාර්යයන් 2

1.4. සංවිධාන ව්‍යූහය 3

1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 4

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම **5**

පරිච්ඡේදය 03 - වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය **9**

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 9

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 10

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය 11

3.4. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 12

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය 12

3.6. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 12

3.7. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 13

පරිච්ඡේදය 04 - කාර්ය සාධන දර්ශක **14**

4.1. බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 14

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය **15**

5.1. හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු 15

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 15

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **17**

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 17

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය 19

6.3. මානව සම්පත් සංවර්ධනය 19

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **20**

1

ආයතනික පැතිකඩ /ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

2020 අගෝස්තු මස 09 වන දින නව රාජ්‍ය අමාත්‍යාංශයක් වශයෙන් ස්ථාපිත කරන ලද මෙම අමාත්‍යාංශය සැලසුම් සහගත පුළුල් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරමින් පවතින අතර බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය සමඟ එක්ව මනා සම්බන්ධීකරණයකින් කටයුතු කරමින් පවතී. "පුනරුත්ථාපනය තුළින් නීතිගරුක සමාජයක්" යන දැක්ම කරා ගමන් කරන මෙම අමාත්‍යාංශය ඉදිරියේදී බොහෝ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කරමින් පවතී.

1.2. දැක්ම, මෙහෙවර, අරමුණු

❋ දැක්ම

පුනරුත්ථාපනය තුළින් නීතිගරුක සමාජයක්...

❋ මෙහෙවර

මූල්‍ය හා මානව සම්පත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස උපයෝජනය කරමින් ,රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන ප්‍රතිසංස්කරණය කරමින් මනා අධීක්ෂණය හා සම්බන්ධීකරණය තුළින් රැඳවියන් පුනරුත්ථාපනය කර යහපත් පුරවැසියන් ලෙස සමාජ ගතකිරීම.

✵ සුවිශේෂී ප්‍රමුඛතා

- ❖ ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර තුළ සිදුවන සමාජ විරෝධී ක්‍රියා තුරන් කිරීම සඳහා පියවර ගැනීම.
- ❖ ජනාධිපති කාර්යසාධක බලකාය හා එක්ව බන්ධනාගාර යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.
- ❖ බන්ධනාගාර තුළ අපරාධකරුවන් අධීක්ෂණය සඳහා නූතන තාක්ෂණික ක්‍රමවේදයන් ස්ථාපිත කිරීම.
- ❖ සිරකරුවන්ගේ තදබදය අවම කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම.
- ❖ සිරකරුවන් පුනරුත්ථාපනය සඳහා පුළුල් ක්‍රමවේදයක් සකස් කිරීම.
- ❖ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, සේවක පරිපාලන ගැටළු කඩිනමින් විසඳීම.

1.3. කර්තව්‍යයන් හා කාර්යයන්

අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මහපෙන්වීම මත“නීතියේ ආධිපත්‍ය ආරක්ෂා කිරීම“ සඳහා අදාල නීති සහ අණපනත්වලට අනුකූලව බන්ධනාගාර ප්‍රතිසංස්කරණ හා සිරකරුවන් පුනරුත්ථාපන විෂයට අදාල ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වීම, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ යටතේ ඇති ආයතනයන්හි විෂයන් හා කාර්යයන් සහ ඊට අදාල ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම හා ඇගයීම.

1.4. සංවිධාන ව්‍යූහය


ගරු රාජ්‍ය අමාත්‍ය
ලේකම්
අතිරේක ලේකම් (පාලන)
අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන I)
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන II)
අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
ඉංජිනේරු (I පන්තිය)
ප්‍රධාන ගණකාධිකාරී
ප්‍රධාන අභ්‍යන්තර විගණක
නීති නිලධාරී
සහකාර ලේකම් (පාලන I)
සහකාර ලේකම් (පාලන II)
සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) (II/IIIපන්තිය)
ඉංජිනේරු (II/III පන්තිය)
ගණකාධිකාරී
අභ්‍යන්තර විගණක
ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්
පරිපාලන නිලධාරී
තොරතුරු තාක්ෂණ නිලධාරී
පාලන I අංශය
පාලන II අංශය
සංවර්ධන/ ක්‍රමසම්පාදන/ තොරතුරු තාක්ෂණ අංශය
ඉංජිනේරු අංශය
ගිණුම් අංශය
අභ්‍යන්තර විගණක අංශය

1.5. අමාත්‍යාංශය යටතේ පවතින ආයතන



2

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2021 වර්ෂයේ සිදුකළ ප්‍රමුඛ කාර්යයන් හි ප්‍රගතිය

2020 අගෝස්තු මස 09 වන දින නව රාජ්‍ය අමාත්‍යාංශයක් වශයෙන් ස්ථාපිත කළ මෙම අමාත්‍යාංශය විසින් 2021.01.01 සිට 2021.12.31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය තුළ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යන ආයතන විසින් සිදුකළ පහත කාර්යයන් සම්බන්ධයෙන් අධීක්ෂණය, මෙහෙයවීම හා පසුවිපරම යන කර්තව්‍යයන් සිදුකරන ලදී.

1. දරුණු ඝනයේ අපරාධකරුවන් විසින් බන්ධනාගාර තුළ සිට සිදුකරනු ලබන විවිධ අපරාධ හා දූෂණ ක්‍රියා හේතුවෙන් සමාජය තුළ ගැටළුකාරී තත්ත්වයක් පසුගිය වසර කිහිපය පුරාම ඇතිවිය. මෙම දරුණු ඝනයේ අපරාධකරුවන් වෙනම රඳවා තබාගැනීම සඳහා බූස්ස බන්ධනාගාරය අධි ආරක්ෂිත බන්ධනාගාරයක් ලෙස සංවර්ධනය කිරීමට හැකිවිය. ඒ අනුව බූස්ස බන්ධනාගාරයේ අධි ආරක්ෂිත සිරමැදිරි 107ක් ඝකස් කිරීමට සැලසුම් කළ අතර මේ වන විට ඒ සියල්ලෙහි වැඩ නිමකර දරුණු ඝනයේ අපරාධකරුවන් රඳවීමට කටයුතු සලසා තිබේ.

2. වර්තමානයේ බන්ධනාගාර පද්ධතිය මුහුණදෙන ප්‍රධානතම ගැටළුවක් වන බන්ධනාගාර තුළ පවත්නා අධික තදබදය සම්බන්ධව අතිගරු ජනාධිපතිතුමාගේ විශේෂ අවධානය යොමු වී ඇත. ඒ අනුව පොදු සමාව ලබාදීමේ ප්‍රතිපත්ති ක්‍රියාවලියට අමතරව සමාලෝචන ක්‍රියාවලියක් හරහා විශේෂ සමාවක් ප්‍රදානය කිරීමට යාන්ත්‍රණයක් ඝකස් කිරීම සිදුකර ඇත. එය මෙම රාජ්‍ය අමාත්‍යාංශයට ලබාදී ඇති සුවිශේෂී ප්‍රමුඛතා අතරින් එකකි.

3. අධික බන්ධනාගාර තදබදය සඳහා මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහි වී බන්ධනාගාරගත වන රඳවියන් ප්‍රමාණය දිනෙන් දින ඉහළ යාම ප්‍රධාන හේතුවක් වශයෙන් මෙම අමාත්‍යාංශය හඳුනාගෙන ඇත. රඳවි තදබදය අධික වීම මත මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී සිරගතවන්නන් සඳහා විධිමත් ප්‍රතිකාර හා පුනරුත්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉතා අපහසුය. මීට පිළියමක් වශයෙන් වීරවිල බන්ධනාගාරය තුළ මත්ද්‍රව්‍යවලට ඇබ්බැහි වී වරදකරුවන් වන පුද්ගලයන් සඳහා ප්‍රතිකාර හා පුනරුත්ථාපන මධ්‍යස්ථානයක් ඉදි කරමින් පවතී.

4. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ අනුග්‍රහයෙන් කොවිඩ් 19 වසංගත තත්ත්වය පැවති කාලය තුළ සියලුම බන්ධනාගාර ආයතනයන්ට CDMA දුරකථන සේවය ලබාදුන් අතර එමගින් නේවාසිකයින්ට නොමිලේ දුරකථන ඇමතුම් සිය පවුලේ සාමාජිකයින් වෙත ලබාගැනීමට අවස්ථාව සැලසිණි.

5. බන්ධනාගාර රඳවියන්ගේ තොරතුරු ඉතා කඩිනමින් හා නිවැරදිව ලබාගැනීම සඳහා ආරම්භ කර ඇති පරිගණක ජාල ක්‍රම මගින් තොරතුරු ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතිය මේ වනවිට සියලුම බන්ධනාගාරවල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් ඇත. ඒ ඔස්සේ තොරතුරු ඒකාබද්ධ කර සන්නිවේදනයේ කඩිනම් ක්‍රමයක් ඇති කිරීමට පියවර ගනිමින් පවතී.

6. බන්ධනාගාරගත වන රැඳවියන්ගේ ආරක්ෂාව, රැකවරණය හා අධිකරණ වෙත ඉදිරිපත් කිරීම සඳහා බන්ධනාගාර ආයතනවලට ප්‍රමාණවත් නිලධාරීන් සංඛ්‍යාවක් සිටීම අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරී හිඟයට පිළියමක් වශයෙන් නියාමක නිලධාරීන් 595 ක් කඩිනමින් බඳවාගැනීමට කටයුතු කර ඇත.

7. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව බන්ධනාගාරවල ආරක්ෂාව තරකිරීමට මෙන්ම බන්ධනාගාර බුද්ධි අංශ ශක්තිමත් කිරීම සඳහා ත්‍රිවිධ හමුදාවෙන් නීත්‍යානුකූලව ඉවත් වූ නිලධාරීන් 500ක් බන්ධනාගාර සේවයට බඳවාගැනීමට කටයුතු කරමින් පවතී. ඉන් 194 දෙනෙකු 2021 වර්ෂයේදී බඳවා ගන්නා ලදී.

8. 2021 වර්ෂයේ දී වරදකරුවන් 5743ක් ප්‍රජා විශෝධන ආඥාවන් යටතේ ප්‍රජා විශෝධනයට යොමුකර ඇත. මෙය බන්ධනාගාර තදබදය අවම කිරීමට දැඩි පිටිවහලක් විය.

9. වරදකරුගේ සුබසිද්ධිය උදෙසා අධිකරණයේ අභිමතය පරිදි ප්‍රජා විශෝධන ආඥාවක් ලබාදීම සඳහා 1999 අංක 49 දරණ ප්‍රජාපාදක විශෝධන පනතේ 07වන වගන්තිය සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී. තවද වගන්ති කිහිපයක් සංශෝධනය කිරීමට ද කටයුතු කරමින් පවතී.

10. බන්ධනාගාර දෙපාර්තමේන්තුව මුහුණ දෙන ප්‍රධානතම අභියෝගය වන්නේ අධික රැඳවි තදබදයයි. 2021 වසර ආරම්භයේ 22000කට අධික වූ රැඳවි ප්‍රමාණය වර්ෂය අවසානය වනවිට නඩු කටයුතු විධිමත් කිරීම හා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලිය වැනි ක්‍රමවේදයන් අනුගමනය කිරීම තුළින් 18400ක පමණ ප්‍රමාණයකට අඩුකර ගැනීමට හැකි විය.

11. බන්ධනාගාර රැඳවියන්ට වීඩියෝ තාක්ෂණය ඔස්සේ සිය ඥාතීන් බැලීම සඳහා අවස්ථාව සලසා දීමේ වැඩසටහනක් 2020 වර්ෂයේදී ඇරඹී අතර මූලිකව අගුණකොළපැලැස්ස බන්ධනාගාරය තුළ ක්‍රියාත්මක වූ මෙම වැඩසටහන 2021 වර්ෂය අවසන් වන විට සියලුම බන්ධනාගාරයන් හි ක්‍රියාවට නංවමින් පවතී.

12. බන්ධනාගාර රැඳවියන් බැලීමට පැමිණි ඥාතීන්ට සිදුවන විවිධ දුෂ්කරතා මහහැරීම සඳහා වේලාව වෙන්කරවාගෙන පැමිණීමේ (Pre booked visit) ක්‍රමය හඳුන්වා දී ඇත. මේ අනුව අවශ්‍ය වේලාව වෙන්කරවාගෙන සිය ඥාතීන් බැලීමට අවස්ථාව උදා වේ.

13. අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් අනුව මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් 8000ක් පුනරුත්ථාපනය කිරීමේ වගකීම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට පවරා ඇත. ඒ අනුව ඉරහඳකෙටුවැව, කන්තලේ හා නොච්චියාගම ප්‍රදේශයන්හි නව පුනරුත්ථාපන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගෙන අදාල අළුත්වැඩියාවන් සිදුකිරීම 2021 වර්ෂයේදී ආරම්භ විය.

14. පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යටතේ ඇති සේනපුර තෘතියික හා වෘත්තීය සාක්ෂරතා පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘති 12 අතරින් 2021 වර්ෂය තුළ රු. මිලියන 38.75 ක වටිනාකමින් යුතු ව්‍යාපෘති 03ක වැඩ නිමකර ඇත.

ඉහත කාර්යයන් අධීක්ෂණය කිරීම සඳහා මෙම කාලය තුළ මෙම අමාත්‍යාංශය විසින් එක් එක් ආයතන විසින් සිදුකරන ලද කාර්යයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය කළ අතර ඉදිරි කටයුතු සඳහා එම ආයතන මෙහෙයවමින් සාකච්ඡාවලදී ගත් තීරණ ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසුවිපරම් කරන ලදී.

අනු අං.	කාරණය	රැස්වීම් ගණන
1.	ප්‍රගති සමාලෝචන රැස්වීම් ➢ මාසික ප්‍රගති සමාලෝචන සාකච්ඡා ➢ 2021 ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රගති සමාලෝචනය	 7 2
2.	බන්ධනාගාර ආරක්ෂාව තහවුරු කිරීම සඳහා හදිසි ප්‍රතිචාර උපක්‍රමික බලකාය පිහිටුවීම	2
3.	බන්ධනාගාර රැඳවියන් ශ්‍රම බලකායක් වශයෙන් උපයෝගී කරගැනීම	1
4.	ඉදිකිරීම් ➢ බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉදිකිරීම් ➢ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ඉදිකිරීම්	 4 1
5.	සිරකරු තදබදය අවම කිරීමේ යාන්ත්‍රණයක් පිහිටුවීම	5
6.	මහර බන්ධනාගාරය විධිමත් කිරීම	2
7.	සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	3
8.	පුනරුත්ථාපන ක්‍රියාවලිය විධිමත් කිරීම	1

මීට අමතරව 2021 වර්ෂයේ කාර්තු 04 සඳහා වූ ප්‍රගති වාර්තාවන් ව්‍යාපෘති කළමනාකරණ දෙපාර්තමේන්තුව වෙත ලබාදී ඇත.

එසේම 2020.11.29 වන දින මහර බන්ධනාගාරයේ ඇතිවූ කැරැල්ල පාදක කරගනිමින් ගරු අධිකරණ අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි එම සිදුවීම විමර්ෂනය කිරීමට පත්කළ කමිටුවේ නිර්දේශ මත හඳුනාගන්නා ලද ක්‍රියාකාරකම් 2021 වර්ෂයේදී ක්‍රියාවට නැංවීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව මෙහෙයවන ලදී. විශේෂයෙන්ම නැවත මෙවැනි තත්ත්වයක් උද්ගත වුවහොත් සිදුවිය හැකි හානි අවම කරගත හැකිවන පරිදි විනාශයට පත් වූ ගොඩනැගිලි බන්ධනාගාර භූමියේ පිටත ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන ඇති අතර 2022 අයවැය මගින් ප්‍රතිපාදන ලබාගැනීමට කටයුතු කර ඇත. එහි ඉදිකිරීම් කටයුතු 2022 වර්ෂයේදී ආරම්භ කිරීමට නියමිතය.

බන්ධනාගාර තදබදය දැඩිව පැවති මෙම අවධියේ 20000කට අධික වූ රක්ෂිත බන්ධනාගාරගත රැඳවි ප්‍රමාණය අවම කිරීම සඳහා ඒ හා සම්බන්ධ ආයතන වන ශ්‍රී ලංකා පොලිසිය, අධිකරණ අමාත්‍යාංශය, අධිකරණ සේවා කොමිෂන් සභාව හා නීතිපති දෙපාර්තමේන්තුව වැනි ආයතනයන් සමඟ ඒකාබද්ධව කටයුතු කරමින් ඔවුන්ගේ සහයෝගීතාවය ද සමඟ රක්ෂිත රැඳවියන් සංඛ්‍යාව 11110ක් දක්වා අඩුකරගැනීමට හැකියාව ලැබී ඇත.

බන්ධනාගාර රැඳවියන්ගේ තොරතුරු ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීම සඳහා 2021 වර්ෂයේදී බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත වෙන්කර තිබූ රුපියල් මිලියන 15ක ප්‍රතිපාදන බන්ධනාගාර දෙපාර්තමේන්තුවට ලබාදී ඇත. මෙම ප්‍රතිපාදන සාර්ථකව උපයෝජනය කරගනිමින් මෙම ව්‍යාපෘතිය කඩිනම් කිරීමට කටයුතු කර ඇත.

තවද අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි පරිපාලන කටයුතු තවදුරටත් විධිමත් කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩල සංදේශ 10 ක් 2021 වසර තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇත.

2.2. ඉදිරි දැක්ම

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ස්ථාපිත බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යන ආයතන විසින් ඉදිරියේදී සිදුකිරීමට නියමිත පහත කාර්යයන් පිළිබඳව සැලසුම් කිරීමට, අධීක්ෂණය හා මෙහෙයවීමට මෙන්ම ප්‍රගතීන් ඇගයීමට ලක්කිරීම අමාත්‍යාංශය විසින් සැලසුම් කර ඇත.

1. වැලිකඩ බන්ධනාගාර සංකීර්ණය හොරණ මිල්ලෑව ප්‍රදේශයේ අක්කර 200 ක භූමියක පුනස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතී. මේ යටතේ වැලිකඩ බන්ධනාගාරය, මැගසින් බන්ධනාගාරය, කාන්තා අංශය, බන්ධනාගාර රෝහල හා බන්ධනාගාර පුහුණු පාසල ප්‍රතිස්ථාපනය කිරීමට නියමිතය. මීට අමතරව බන්ධනාගාර මූලස්ථානය බත්තරමුල්ල ප්‍රදේශයට ද බන්ධනාගාර නිල නිවාස මාලබේ ප්‍රදේශයට ද විතැන් කිරීමට සැලසුම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා රු. බිලියන 31.4ක් වැය වෙතැයි අපේක්ෂා කෙරේ.

2. වාරියපොල බන්ධනාගාරය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ හා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය මේ වනවිටත් ලබාගෙන තිබේ. මෙම ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 1244.6 ක් ඇස්තමේන්තු කර ඇත. මෙම ව්‍යාපෘතිය 2022 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට නියමිතය.

3. බන්ධනාගාර පරිපාලනය හා ආරක්ෂාව සඳහා නව තාක්ෂණය යොදාගැනීමට කටයුතු කරමින් පවතී.

   මේ යටතේ වැලිකඩ බන්ධනාගාර සංකීර්ණයේ රුපියල් මිලියන 47 ක වියදමින් සිසිටිවී කැමරා පද්ධතියක් ස්ථාපිත කරමින් පවතී. තවද රුපියල් මිලියන 17.8ක් කළුතර, මහර හා මීගමුව බන්ධනාගාරවල සිසිටිවී කැමරා පද්ධති සවිකිරීම සඳහා වෙන් කර තිබූ අතර ඉන් කළුතර හා මීගමුව බන්ධනාගාරවල සිසිටිවී කැමරා පද්ධති සවිකිරීම අවසන් කර ඇත.

4. ප්‍රජා පාදක විශෝධන ක්‍රමය පුළුල් කිරීමේ අවශ්‍යතාව මෙම අමාත්‍යාංශය විසින් හඳුනාගෙන ඇති අතර ඒ අනුව ඉදිරි වසර කිහිපය තුළ ප්‍රජා විශෝධන ආඥාලාභීන් 20000ක් පුනරුත්ථාපනය කිරීමට සැලසුම් කර ඇත.

5. මත්ද්‍රව්‍යවලට ඇබ්බැහිවූවන් පුනරුත්ථාපනය කිරීමේ වගකීම පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට ලබාදී ඇත. ඒ අනුව ඉදිරියේදී මත්ද්‍රව්‍යයන්ට ඇබ්බැහිවූවන් 8000ක් පුනරුත්ථාපනය කිරීමට ප්‍රමාණවත් වන පරිදි පුනරුත්ථාපන මධ්‍යස්ථාන ප්‍රමාණය පුළුල් කිරීමට සැලසුම් කර ඇත.

මේජර් ජෙනරල් වී ආර් සිල්වා (විශ්‍රාමික) ආර්එස්පී වීඑස්වී යූඑස්පී එන්ඩීයූ අයිජී

ලේකම්

මේජර් ජෙනරාල් (විශ්‍රාමික) වී.ආර්. සිල්වා
ලේකම්
බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන්
පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය
අංක. 40, බුත්ගමුව පාර, රාජගිරිය

3

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

රු.

අයවැය 2021		සටහන	තත්‍ය 2021	තත්‍ය නැවත ගලපන ලද 2020	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-		ඒසීඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		639,880,000	312,539,390	ඒසීඒ-3
-	නැන්පතු		8,922,563	12,942,138	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		7,155,129	39,433,545	ඒසීඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-		
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**655,957,692**	**364,915,073**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**655,957,692**	**364,915,073**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**475,716**	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ - (ඇ)-(ඈ)		**655,481,976**	**364,915,073**	
	අඩුකළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
65,800,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	45,436,136	10,275,173	
80,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	67,870,886	10,660,136	
260,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	202,631,246	189,397,863	
-	පොළී ගෙවීම්	**8**	-	-	ඒසීඒ-2(ii)
-	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	-	-	
407,100,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**315,938,268**	**210,333,172**	
	මූලධන වියදම්				
4,100,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	2,997,109	346,029	
5,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	6,603,739	854,029	
1,100,000,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	476,469,765	288,513,599	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
1,500,000	හැකියා වර්ධනය	**14**	128,000	-	
19,500,000	වෙනත් මූලධන වියදම්	**15**	19,158,722	-	
1,130,600,000	**මුළු මූලධන වියදම් (උ)**		**505,357,336**	**289,713,657**	
	නැන්පතු ගෙවීම්		16,733,522	5,868,766	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		5,824,939	52,913,417	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**22,558,461**	**58,782,183**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		843,854,065	558,829,012	
1,537,700,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(188,372,089)**	**(193,913,939)**	
	අග්‍රම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(188,372,089)**	**(193,913,939)**	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2021 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය	
		2021	**2020**
		රු.	රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	287,992,491	244,350,027
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	12,149,682	13,479,872
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**300,142,173**	**257,829,898**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(772,276)	(7,253,046)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		287,992,491	244,350,027
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසීඒ-4	12,921,958	20,732,917
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**300,142,173**	**257,829,898**

පිටු අංක 07 සිට 50 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 51 සිට 59 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළදිරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : ෂ්/ඔ3/2022

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23/03/2022

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
අධිකරණ අමාත්‍යාංශය
උපරිමාධිකරණ සංකීර්ණය
කොළඹ 12.

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමිසාරිස් (මුදල්)
නම :
දිනය : 22.03.2022

ආර්.ටී.ඩබ්.ඒ.ඒ. රත්නායක
ප්‍රධාන මූල්‍ය නිලධාරි
මහධිකාරණ සමෝධානකරණ හා සිරකරුවන්
පුනරුත්ථාපන සේවකයු රාජ්‍ය අමාත්‍යාංශය
නො.40, ඩිප්ලමැටික් පාර, රාජගිරිය.

3.3. මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසීඒ-සී

2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තත්‍ය	
	2021	**2020**
	රු.	**රු.**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	13,229,349	610,467
අග්‍රිම ලැබීම්	639,880,000	312,380,174
අත්තිකාරම් අයකරගැනීම්	6,198,784	5,386,631
තැන්පතු ලැබීම්	8,922,563	12,942,138
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**668,230,696**	**331,319,411**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	315,557,383	20,935,309
සහනාධාර සහ මාරුකිරීම්	348,685	74,747,813
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	7,937,943	30,839,310
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	475,716	-
අත්තිකාරම් ගෙවීම්	6,420,111	8,341,612
තැන්පතු ගෙවීම්	16,733,522	5,868,766
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**347,473,360**	**140,732,810**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**320,757,336**	**190,586,601**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	320,757,336	190,586,601
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**320,757,336**	**190,586,601**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(320,757,336)**	**(190,586,601)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

ආදායම් ක්ෂේත්‍රය	ආදායම් ක්ෂේත්‍රයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ %ක් ලෙස
-	-	-	-	-	-

3.5. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වියදම් ඇස්තමේන්තුව		තත්‍ය වියදම	අවසන් ආදායම් ඇස්තමේන්තුවේ %ක් ලෙස
	මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව		
පුනරාවර්තන	407,100	402,220	315,938.268	79
ප්‍රාග්ධන	1,130,600	1,135,480	505,357.336	45

3.6. මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබාදුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසන් ප්‍රතිපාදන		
	අධිකරණ අමාත්‍යාංශය	ගොඩනැගිලි කුලී ගෙවීම සඳහා (2 වන හා 3වන මහල භාවිතා කිරීම)	5,400	5,400	5,400	100
	රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය	උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු දීමනාව	4,020	4,020	2,366.666	59
	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	ආපදා ණය ශේෂය නිරවුල් කිරීම	171.276	171.276	171.276	100

3.7. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු. ,000

වත්කම් ක්ෂේත්‍රය	ක්ෂේත්‍ර විස්තරය	2021.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්ගත කිරීමට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ	287,992.491	287,992.491	-	-
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘෂ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන වත්කම්	-	-	-	-

4

කාර්යසාධක දර්ශක

4.1. බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධක දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100%-90%	75%-89%	50%-74%
රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අවම කිරීම		75%	
බන්ධනාගාර රැඳවූවන්ගේ තදබදය අවම කිරීම සඳහා පොදු සමාව දීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාවලියකට අමතරව සමාලෝචන ක්‍රමවේදයක් හරහා විශේෂ සමාව ප්‍රදානය කිරීමේ යාන්ත්‍රණයක් සකස් කිරීම	100%		
බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවක පරිපාලන ගැටළු කඩිනමින් විසඳීම			50%

5

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබාගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී හා පරිපූර්ණ සමාජයක් ඇති කිරීමට, යුක්තිය සඳහා සැමට අවස්තාව ලබාදීම සහ සෑම මට්ටමකටම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩනැගීම	සියලු දෙනාටම නීතියේ සාධාරණත්වය ලබාගැනීමට හැකිවීම සහ ජාතික හා අන්තර්ජාතික මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම	සමස්ත සිරකරුවන් සංඛ්‍යාවෙන් දඬුවම් නියම නොකළ රැඳවියන් ප්‍රමාණය		70%	

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

අප රටේ බන්ධනාගාර තදබදයට ප්‍රධානතම හේතුවක් වී ඇත්තේ අධික රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන්ගේ ප්‍රමාණයයි. මහේස්ත්‍රාත් අධිකරණ දිවයිනේ සෑම ප්‍රදේශයකම ස්ථාපිත වී ඇත. පොලිස් සේවය ද ව්‍යාප්ත වී ඇත. පොලිසිය, අධිකරණය, බන්ධනාගාරය අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ ප්‍රධාන ආයතන 03ක් වේ. අනෙක් ආයතන දෙක හා සසඳන විට බන්ධනාගාර සේවය පුළුල් වී නොමැත. මෙම තත්ත්වය තුළ වර්තමානයේ බන්ධනාගාර පරිපාලනය මුහුණ දී ඇති ප්‍රධානම ගැටළුව වන්නේ බන්ධනාගාර තුළ පවත්නා දැඩි තදබදයයි. ශ්‍රී ලංකාවේ බන්ධනාගාර පද්ධතිය තුළ රැඳවිය හැකි සිරකරුවන් ප්‍රමාණය 11762කි. නමුත් 2021 දෙසැම්බර් 31 දින වන විට මුළු රැඳවියන් ප්‍රමාණය 18325 ක් විය. එම ප්‍රමාණයෙන් රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය 11107ක් විය. බන්ධනාගාරයක් තුළ සිටින දඬුවම් නියම වූ රැඳවියන් ප්‍රමාණයට සාපේක්ෂව රක්ෂිත බන්ධනාගාරගත කළ රැඳවියන් ප්‍රමාණය විශාල ලෙස ඉහළ යාම එතරම් හිතකර තත්ත්වයක් නොවන බව හඳුනාගෙන ඇත. මේ සඳහා පසුගිය මාස කිහිපය තුළ ගත් දැඩි ප්‍රයත්නයක ප්‍රතිඵලයක් වශයෙන් රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අවම කරගැනීමට හැකියාව ලැබී ඇත.

බන්ධනාගාර තදබදයට ප්‍රධාන හේතුව වී ඇති රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අඩු කරගැනීම විශාල අභියෝගයක් වී ඇත. රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අඩු කරගැනීමේදී බන්ධනාගාර දෙපාර්තමේන්තුවට පමණක් එම අභියෝගය තනිව ජයගත නොහැක. පොලිසිය, අධිකරණය වැනි අපරාධ යුක්ති විනිශ්චය පද්ධතියේ අනෙකුත් ආයතන වෙතද විශාල කාර්යභාරයක් පැවරී ඇත. අධික බන්ධනාගාරගත තදබදය විසඳීමට ප්‍රධාන ක්‍රම 02ක් හඳුනාගෙන ඇත. ඉන් එකක් වන්නේ සිරකරුවන් ප්‍රමාණය අඩුකිරීමය. මෙහිදී රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අඩු කර ගැනීම අත්‍යාවශ්‍යම කාරණයක් වේ. දෙවනුව කළ යුත්තේ බන්ධනාගාර ඉදිකිරීම හෝ තිබෙන බන්ධනාගාරවල ගොඩනැගිලි පහසුකම් වැඩිකිරීමයි. සංවර්ධිත රටවල පවා නව බන්ධනාගාර ඉදිකිරීම මිල අධික යෝජනාවකි. එහෙයින් අප රටට වඩාත් යෝග්‍ය වන්නේ බන්ධනාගාරවලට ඇතුළත් කරන සංඛ්‍යාව අඩු කර ගැනීමයි. විශේෂයෙන්ම වැඩිවන ජනගහනයට සාපේක්ෂව නව බන්ධනාගාර ඉදිකිරීම ආර්ථික වශයෙන් ද එතරම් හිතකර නොවේ. එහෙයින් ප්‍රජා පාදක විශෝධන ක්‍රමය වඩාත් ශක්තිමත්ව ක්‍රියාත්මක කිරීමේ දැඩි අවශ්‍යතාවයක් හඳුනාගෙන ඇත. මෙම තත්ත්වය තුළ රක්ෂිත බන්ධනාගාරගත රැඳවියන් ප්‍රමාණය අඩුකරගනිමින් හා විකල්ප දඬුවම් ක්‍රම අනුගමනය කරමින් බන්ධනාගාර තුළ අධික තදබදය අවම කිරීම සඳහා ක්‍රියාකිරීම අප ඉදිරියේ ඇති ප්‍රමුඛතම අභියෝගයයි.

6

මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු/ අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	17	10	7
තෘතියික	3	2	1
ද්විතීක	107	31	76
ප්‍රාථමික	23	20	3

❖ විස්තරාත්මක ලේඛනයක් පහතින් දක්වා ඇත.

2021.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු

අනු අං	තනතුරේ ස්වභාවය	තනතුර	අදාළ වන සේවය	ශ්‍රේණිය	වැටුප් ක්‍රමය රා.ප 03/2016)	අනුමත කාර්ය මණ්ඩලය	දැනට කාර්ය මණ්ඩලය	හිඟ/අතිරික්ත
1	ජ්‍යෙෂ්ඨ මට්ටම	ලේකම්				1	1	0
2		අතිරේක ලේකම්	SLAS	special	SL 3	1	1	0
3		අතිරේක ලේකම් (විශේෂ ව්‍යාපෘති)✪	-	special	SL 3	1	1	0
4		ප්‍රධාන මූල්‍ය නිලධාරී	SLAcS	special	SL 3	1	1	0
5		ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන I)	SLAS	I	SL 1	1	1	0
6		ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (පාලන II)	SLAS	I	SL 1	1	1	0
7		ප්‍රධාන ගණකාධිකාරී	SLAcS	1	SL 1	1	1	0
8		ප්‍රධාන අභ්‍යන්තර විගණක	SLAcS	I	SL 1	1	0	1

9		අධ්‍යක්ෂ	SLPS	I	SL 1	1	1	0
10		ඉංජිනේරු	SLES	I	SL 1	1	0	1
11		අභ්‍යන්තර විගණක	SLAcS	III	SL 1	1	0	1
12		සහකාර ලේකම් (පාලන I)	SLAS	III	SL 1	1	0	1
13		සහකාර ලේකම් (පාලන II)	SLAS	II/ III	SL 1	1	1	0
14		සහකාර අධියක්ෂ	SLPS	II/ III	SL 1	1	0	1
15		ඉංජිනේරු	SLES	II/ III	SL 1	1	0	1
16		ගණකාධිකාරී	SLAcS	II/ III	SL 1	1	1	0
17		නීති නිලධාරී	Dept	II/ III	SL 1	1	0	1
		එකතුව				**17**	**10**	**7**
18	කෘෂිය මට්ටම	පරිපාලන නිලධාරී	PMAS	Supra	MN 7	1	0	1
19		ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්	Tempo.			1	1	0
20		තොරතුරු තාක්ෂණ නිලධාරී			MN 6	1	1	0
		එකතුව				**3**	**2**	**1**
21	ද්විතීය මට්ටම	සංවර්ධන නිලධාරී	Dos		MN 4	89	16	73
22		රාජ්‍ය කළමනාකරණ සහකාර	PMAS	I/ II/ III	MN 2	15	14	1
23		වීඩියෝ කැමරා ශිල්පී ✪	MA(T) 3		MT 1	1	1	0
		තොරතුරු තාක්ෂණ සහකාර			MT1	1	0	1
24		නිශ්චල ඡායාරූප ශිල්පී	Tempo.			1	0	1
		එකතුව				**107**	**31**	**76**
25	ප්‍රාථමික මට්ටම	රියදුරු	DS		PL 3	12	9	3
26		කා.කා.ස.	OES		PL 1	10	10	0
27		කැමරා ක්‍රියාකරු සහායක	Tempo.			1	1	0
		එකතුව				**23**	**20**	**3**
		මුළු එකතුව				**150**	**63**	**87**

✪ දරන්නාට පෞද්ගලික වන තනතුරු

*** **සංවර්ධන නිලධාරී තනතුරු 58ක් අනුමත කර ඇත්තේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය වෙත අනුයුක්ත කිරීම සඳහාය**

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇති ආකාරය

මෙම රාජ්‍ය අමාත්‍යාංශය යටතේ බන්ධනාගාර දෙපාර්තමේන්තුව, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය යන විශාල කාර්ය වපසරියන් සහිත ආයතන ක්‍රියාත්මක වන බැවින් එම ආයතනවලට අදාල සම්බන්ධීකරණ ඇතුළු කටයුතු රාශියක් ඉටු කළ යුතුව තිබේ. එබැවින් එම කටයුතු වෙනුවෙන් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නොමැති වීම ප්‍රශස්ත සේවයක් ලබාදීම හා කාර්යක්ෂමතාවයට සෘජුවම බලපාන බැවින් පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම අත්‍යාවශ්‍ය වී ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම / ලබාගත් දැනුම*
			දේශීය	විදේශීය		
කාර්යාල ක්‍රම පිළිබඳ පුහුණු වැඩමුළුව	06	දින 02	රු.48,000.00		දේශීය	
ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව	01	එක් අවුරුදු පාඨමාලාව	රු.80,000.00		දේශීය	
දෙමළ භාෂාව පිළිබඳ පාඨමාලාව	30	පැය 150	රු.112,000.00		දේශීය	

අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ (සංවර්ධන නිලධාරි සහ කළමනාකරණ සේවා නිලධාරි) වැඩි වශයෙන් නවක නිලධාරීන් කටයුතු කරන බැවින් ඉහත පුහුණු වැඩසටහන් අමාත්‍යාංශයේ කාර්යසාධනය සම්බන්ධයෙන් විශාල පිටිවහලක් වනු ඇත.

7

අනුකූලතා වාර්තාව

අංකය	අදාල කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1.	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1.	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2.	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3.	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශය මගින් මෙවැනි ගිණුම් පවත්වාගෙන නොයයි	
1.4.	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.5.	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ		
1.6.	වෙනත්	අනුකූල නොවේ		
2.	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1.	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/218 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2.	පුද්ගල පඩිනඩි ලේඛන/පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3.	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4.	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක නොවීය	
2.5.	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6.	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.7.	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8.	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9.	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10.	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11.	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3.	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1.	මූල්‍ය බලතල ආයතනය තුළ පවරා දී තිබීම	අනුකූල වේ		
3.2.	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3.	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4.	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4.	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1.	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2.	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3.	වාර්ෂික අභ්‍යන්තර විගණන වාර්තාව සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් මෙම අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක නොවීය	
4.4.	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5.	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5.	**විගණන විමසුම්**			
5.1.	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		

6.	**අභ්‍යන්තර විගණනය**			
6.1.	මු.රෙ.134(2) DMA/1-2019 අනුව වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	2021 වර්ෂයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව පැවති නිසා අභ්‍යන්තර විගණනයක් සිදුනොවීය	2022 වර්ෂයේ සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුරේ පුරප්පාඩුව සපුරාගෙන අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීම
6.2.	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ	එම	එම
6.3.	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	එම	එම
6.4.	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	එම	එම
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1.	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක්වත් අදාල වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	2021 වර්ෂයේ අවසන් කාර්තුව සඳහා පමණක් එක් රැස්වීමක් පවත්වා ඇත.		
8.	**වත්කම් කළමනාකරණය**			
8.1.	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2.	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3.	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාල වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.4.	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකර තිබීම	අනුකූල වේ		
8.5.	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදුකිරීම	අනුකූල නොවේ		
9.	**වාහන කළමනාකරණය**			
9.1.	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2.	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අදාල කාල පරිච්ඡේදය තුළ ගර්හිත වාහන නොමැත	
9.3.	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4.	සෑම වාහන අනතුරක්ම සම්බන්ධයෙන් මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5.	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6.	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග්පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම		අදාල කාල පරිච්ඡේදය තුළ කල්බදු ගෙවීම අවසන් වාහන නොමැත	
10.	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1.	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2.	සමාලෝචන වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	අක්‍රීය බැංකු ගිණුම් අමාත්‍යාංශය සතු නොවේ	
10.3.	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

11.	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1.	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2.	මු.රෙ.94(1) ප්‍රකාරව සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12.	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1.	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2.	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූල වේ		
12.3.	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13.	**පොදු තැන්පත් ගිණුම**			
13.1.	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2.	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14.	**අග්‍රිම ගිණුම**			
14.1.	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3.	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4.	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15.	**ආදායම් ගිණුම**			
15.1.	අදාල රෙගුලාසිවලට අනුකූලව, රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදුකොට තිබීම	අනුකූල නොවේ	මෙම අමාත්‍යාංශය ආදායම් රැස්කරන අමාත්‍යාංශයක් නොවේ	
15.2	රැස්කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	එම	
15.3.	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	එම	
16.	**මානව සම්පත් කළමනාකරණය**			
16.1.	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2.	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		

16.3.	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබාදීම**			
17.1.	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීනව පවත්වාගෙන යාම	අනුකූල වේ. නිලධාරියෙකු පත්කොට තොරතුරු ලබා දී ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යනු ලබයි.		
17.2.	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබාදී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පළකිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ. ප්‍රශංසා /චෝදනා පලකිරීමට පහසුකම් සපයා ඇත.		
17.3.	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18.	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1.	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අනුව පුරවැසි සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2.	එම චක්‍රලේඛයේ 2.3. ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ.		
19.	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1.	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2.	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ.		

19.3.	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ. කාර්යසාධන වාර්තා අත්සන් කර ඇත.		
19.4.	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම	අනුකූල වේ.		
20.	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1.	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PAF/C/ SMPMPRA / FS/02/21/19

මගේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 17 දින

23 MAY 2022
344
19 MAY 2022

ලේකම්

බන්ධනාගාර කළමනාකරකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

බන්ධනාගාර කළමනාකරකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

w. g. n. menike

ඩබ්ලිව් .ජී. එන්. මැණිකේ

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත්:- 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

02. ලේකම්, අයිකරණ අමාත්‍යාංශය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PAF/C/SMPMPRA/FS/02/21/19

ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි දින

ලේකම්

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මනය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මනය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම්, විගණකගේ වගකීම් යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, ව්‍යදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරීගේ සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මනය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි නනී හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම් හා තක්සේරු කිරීම් සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු මෙම වාර්තාවේ 1.6.1.1 (ඇ) හා 1.6.1.2 යන ඡේදයන්හි දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.1.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් මිලදී ගන්නා ලද රු.4,706,999 ක්වූ ටයර්වල වටිනාකම මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු බැවින් මූල්‍ය නොවන වත්කම් රු. 4,706,999 කින් වැඩියෙන් පෙන්නුම් කර තිබුණි.

(ආ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනය වන විට වැඩ නිම කරන ලද රු.246,200,000 ක්වූ ගොඩනැඟිලි ඉදිකිරීම් ප්‍රාග්ධනිත කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පිහිටි ගොඩනැඟිල්ල වෙනුවෙන් කුලී අත්තිකාරම් මුදල් ලෙස රු.7,690,560ක්ද, වැඩ අත්තිකාරම් මුදල් ලෙස රු. 19,327,232 ක්ද ගෙවා තිබුණි. එසේ වුවද, මෙම කුලී හා වැඩ අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශන තුල සටහන් කර නොතිබීම හේතුවෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ මූල්‍ය වත්කම් යටතේ කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හා සංචිත ගිණුමේ රු. 27,017,792 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් වැය විෂයයන් 02 කට අදාලව රු.4,569,561 ක වටිනාකමින් යුත් බැරකම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය විසින් ගොඩනැඟිලි ඉදිකිරීම් වෙනුවෙන් බාහිර පාර්ශවයන් වෙත ඇති බැඳීම් වටිනාකම වූ රු.346,210,705 ක් 2021 දෙසැම්බර් 31 දිනට බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ඊ) මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන වටිනාකම රු.287,982,491 ක්වූ මූල්‍ය නොවන වත්කම් භෞතිකව පරීක්ෂා කර තහවුරුවක් ලබාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

1.6.1.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

භෞතික වත්කම් අත්පත් කරගැනීම්වල වටිනාකම ACA- 6 හි දැක්වෙන පරිදි රු. 6,603,739 ක් වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ භෞතික වත්කම් අත්පත් කර ගැනීම්වල වටිනාකමට මූලධන වත්කම් ප්‍රතිසංස්ථාපනය හා වැඩිදියුණු කිරීමේ වියදම, පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ ප්‍රාග්ධන වියදම, හැකියා වර්ධනය, පර්යේෂණ හා සංවර්ධන වියදම් එකතු කර රු.320,757,336 ක් ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා මුදල් වැයකිරීම් රු. 314,153,597 කින් වැඩියෙන් දක්වා තිබුණි. ඒ හේතුවෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකරකම් සඳහා මුදල් වැයකිරීම් වටිනාකම රු.314,153,597 කින් අඩුවෙන් දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුනරාවර්තන වැය විෂයයක හා ප්‍රාග්ධන වැය විෂයයන් 03ක් වෙනුවෙන් වෙන් කරන ලද රු. 3,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි.

(ආ) පුනරාවර්තන වැය විෂයයන් 07ක හා ප්‍රාග්ධන වැය විෂයයන් 03කට අදාලව සියයට 50කට වඩා වැඩියෙන් ඉතිරිවීම් දක්නට ලැබුණි. තවද, වැය විෂයයන් 04 කට මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම් සිදුකිරීමෙන් අනතුරුවත් සියයට 66 සිට සියයට 91 දක්වා පරාසයක ඉතිරිවීම් තිබූ බව නිරීක්ෂණය විය.

2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක්

විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.

2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i)මුදල් රෙගුලාසි 104 (1)	රෙගුලාසි ප්‍රකාරව PG – 9139 දරන වාහනයට 2021 දෙසැම්බර් 28 දින සිදුවූ අනතුර සම්බන්ධයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වීමට 2022 මාර්තු 31 දින දක්වාම කටයුතු කර නොතිබුණි.
(ii)මුදල් රෙගුලාසි 104 (3) හා 104 (4)	අනතුර සිදු වූ වහාම ප්‍රාරම්භක වාර්තාවක්ද, අලාභ හානිය සිදු වූ දිනයේ සිට මාස 3ක් ඇතුලත පූර්ණ වාර්තාවක්ද ඉදිරිපත් කළ යුතු වුවද, වාහන අනතුරු 05 ක් සම්බන්ධයෙන් අනතුර සිදුවී මාස 5 ක සිට වසර 3 ක් දක්වා කාලපරාසයක් තුල වාර්තා ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයක් සිදු වී තිබුණි.
(iii) මුදල් රෙගුලාසි 1641 හා 1642	සමාලෝචිත වර්ෂයේදී අංක KQ – 5420 දරන වාහනය රු. 51,000 ක් වැයකර අළුත්වැඩියා කටයුතු සිදු කලද අනතුර සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ) 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 වන්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 02 (i) ඡේදය	ලියාපදිංචි අයිතිය නොමැතිව පරිහරණය කරන වාහන ලියාපදිංචි ආයතනයේ එකඟතාවය මත තම ආයතනය නමින් ලියාපදිංචි කර ගැනීමට කටයුතු කල යුතු වුවද, අහෝසි වී ගිය අමාත්‍යාංශයෙන් පවරන ලද වාහන 15 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඇ) 2019 දෙසැම්බර් 04 දින දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02 ඡේදය	නිසියාකාර වියදම් පාලන නිර්ණායක යෙදීමත් එම නිර්ණායක මඟින් වියදම් පාලනය වන බව සනාථ කරගැනීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීමක් බව අවධාරණය කර තිබියදීත්, පුනරුත්ථාපන මධ්‍යස්ථාන ආරම්භකල හැකි කාල වකවානු නිශ්චිතව හඳුනාගත නොහැකි තත්වයක් තුල සමාලෝචිත වර්ෂයේ රු.61,801,989 ක හාණ්ඩ මිලදීගෙන තිබුණි.
(ඈ)2021 අප්‍රේල් 09 දිනැති CGIR/2021/02–02දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ලිපිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 5.4.12 මාර්ගෝපදේශය	සමාලෝචිත වර්ෂය තුල බාහිර පාර්ශවයන් වෙතින් හාණ්ඩ හා සේවා මිලදි ගැනීමෙදි ගෙවා ඇති රු.162,898 ක වැට බදු මුදල් සම්බන්ධයෙන් දී ඇති උපදෙස් ප්‍රකාරව කාර්තුවක් අවසානයේ ඊලඟ මාසයේ 15 දින හෝ ඊට පෙර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට කටයුතු කර නොතිබුණි.
(ඉ) 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 13.2 ඡේදය මුදල් රෙගුලාසි 770 (4) (අ)	පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයට අයත් අපහරණය කල යුතු වාහන 03 ක් චක්‍රලේඛය පරිදි සමාලෝචිත වර්ෂය තුලදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

2.4 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

වැඩ තහනමට ලක් වූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු. 229,320 ක්වූ ආපදා ණය ශේෂය වර්ෂ 05 කට වැඩි කාලයක සිට හා මියගිය නිලධාරියකුගෙන් අයවිය යුතු රු. 10,000 ක ආපදා ණය ශේෂය වර්ෂ 2ට වැඩි කාලයක සිට පවතින නමුත් එම ශේෂයන් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වාහන 3ක් සම්බන්ධයෙන් අළුත්වැඩියාවන් නිසි පරිදි සිදුකර ඇති බව තාක්ෂණික ඉංජිනේරුවරයා විසින් නිර්දේශ කර නොතිබියදී 2021 දෙසැම්බර් 31 දින රු. 1,394,835 ක් වටිනා වවුචර් අනුමත කර ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදි පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය සඳහා ගොඩනැඟිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පිහිටි ගොඩනැඟිල්ලේ නක්සේරු වාර්තාව ලබාගැනීමට හා ගොඩනැඟිලි හිමිකරු සමඟ ගිවිසුමට එළඹීමටත් පෙර අදාල ආයතනය සමඟ රු.8,380,420 ක මුදලකට ගොඩනැඟිල්ලේ කාර්යාල බෙදා වෙන්කිරීම් කාර්යය සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. තවද, මාසික කුලී වටිනාකම රු. 2,400,000 ක් ලෙස නක්සේරු කර තිබුණු එකී ගොඩනැඟිල්ල සඳහා එම නක්සේරු වටිනාකමට වඩා රු.163,520 කින් වැඩි කුලී වටිනාකමකට ගිවිසුම්ගතවී තිබීම හේතුවෙන් වසර 02 ක කාලයක් සඳහා රු. 3,924,480 ක කුලී මුදලක් වැඩිපුර ගෙවීමට සිදු වී තිබුණි.

(ii)කාර්යාංශය වෙත වර්ග අඩි 14,524 ක ප්‍රසම්පාදන කොමිෂන් සභා කාර්යාලය පවත්වාගෙන ගිය ගොඩනැඟිල්ල රු. 2,454,556 ක මාසික කුලී මුදලකට ලබා ගැනීම වැඩි ඉඩකඩ පහසුවක් හා ආර්ථිකමය වාසියක් ලබා ගැනීමට හැකි බව දක්වා තිබියදීත්, වර්ග අඩි 19,858 ක ගොඩනැඟිල්ලක් රු. 2,563,520 කට කුලියට ගැනීම නිසා මාසිකව රු.108,964 ක් වැඩිපුර ගෙවා තිබුණි. ඊට අමතරව ස්ථාවර වත්කම්, පරිගණක ජාලය හා කොටස් වෙන්කිරීම් සහිත එකී ගොඩනැඟිල්ල ලබාගැනීමෙන් ලැබීමට තිබූ පහසුකම් අහිමි වී ගොස් තිබුණි. අමාත්‍යාංශය විසින් නියමිත කාලවකවානුව තුලදි නිසි තීරණ නොගැනීම නිසා වර්ෂ 2ක් සඳහා වැඩිපුර කුලී මුදල් ලෙස රු. 2,615,136 ක් හා කාමර වෙන්කිරීම් හා පරිගණක ජාලගත කිරීම සඳහා රු.10,642,740 ක අමතර පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

(ඇ)2017 නොවැම්බර් 22 දිනැති අංක අමප/17/2509/745/016 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පනත් කෙටුම්පත සකස්කිරීම සඳහා අනුමැතිය ලබාදී තිබුණු අතර 2021 අප්‍රේල් 28 දිනැති අංක අමප/21/0564/330/029 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශය පනත් කෙටුම්පත සඳහා නීතිපතිතුමාගේ නිෂ්කාශනය සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටියද, සමාලෝචිත වර්ෂය අවසානය තෙක් පනත් කෙටුම්පතට අදාල කටයුතු නිමකර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් මූලධන වත්කම් අන්පත් කර ගැනීම රු.මිලියන 9.5 වැය කර තිබුණද, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4.3 (අ) ප්‍රකාරව දැන්වීම් පලකිරීම ආර්ථික වශයෙන් අවාසි සහගත වන අඩු වටිනාකම්න් යුත් අයිතමයන් ප්‍රසම්පාදනය කිරීම සඳහා හෝ නිතර භාවිත කරන අයිතමයන් මිලදී ගැනීම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කල යුතු වුවද, අමාත්‍යාංශය විසින් 2021 වර්ෂය සඳහා එසේ සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම සිදුකර නොතිබුණි.

(ආ) අමාත්‍යාංශයේ රු. 2,936,346 ක් හා පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාංශයේ රු. 3,452,906 ක් වටිනා භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.1 ට අනුකූල නොවන පරිදි ලංසු කැඳවීමේ ලියවිලි අනින් භාරදී මිලගණන් ලබාගෙන තිබුණි.

(ඇ) නියමිත පිරිවිතර සැපයුම්කරුවන්ට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් රු. 1,227,889 ක් වටිනා බිම් අතුරන යෙදීම හා Work Station සවිකිරීමේ කාර්යයන්හිදී අවම මිල පමණක් සැලකිල්ලට ගනිමින් සැපයුම්කරු තෝරාගැනීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම තුල ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 (ඊ) පරිදි ඇගයීමේ හා තේරීමේ කාර්යය පටිපාටියේ විනිවිදභාවය හා නීත්‍යභාවය සහතිකවී නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 ට අනුකූල නොවන පරිදි වැට බදු සඳහා ලියාපදිංචි නොවූ සැපයුම්කරුවකු වෙත රු. 807,840 ක Work Station සවිකිරීම හා රු. 422,049 ක බිම් ඇතුරුම් යෙදීමේ කාර්යයන්ට අදාලව වැට බදු ලෙස රු.89,393 ක් ගෙවීම් සිදුකර තිබුණි. තවද, 2022 මාර්තු 28 දින සැපයුම්කරු විසින් වැට බදු මුදලින් රු.59,840 ක් ආපසු අමාත්‍යාංශය වෙත ගෙවීම් තුළ මිලගණන් විවෘතකිරීමේ කමිටුව, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව විසින් වැට බදු සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

3.3 වාහන පාලනය

2018 ජූලි 01 දින අනතුරකට ලක්වී ඇති PH-1288 දරන කැබ් රථයේ අළුත්වැඩියා කිරීමේ වියදම රු.2,290,015ක්වූ අතර මෙයින් රු.1,698,894ක් ජාතික රක්ෂණ භාර අරමුදලෙන් ලැබී තිබුණු අතර ඉතිරි මුදල වූ රු.591,120 ක් අමාත්‍යාංශයට වැය බරක් වීමෙන් එම අලාභය සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා 40 (2) (1) වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 5.3 ඡේදය පරිදි අවම වශයෙන් කාර්තුවකට වරක් වර්ෂයකට 4 ක් වන පරිදි රැස්වීම් පැවැත්විය යුතු වුවද, එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි.

5 මානව සම්පත් කළමනාකරණය

5.1 අනුමත කාර්ය මණ්ඩලය , තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 92 ක් හා තත්‍ය කාර්ය මණ්ඩලය 62 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදි පුද්ගල පඩිනඩි වෙනුවෙන් රු. 45,436,136 ක් වැයකර තිබුණි.

w. g. m. menuka

ඩබ්ලිව්.ජී.එන්.මැණිකේ

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත් - 01. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

02. ලේකම්,අධිකරණ අමාත්‍යාංශය